# මේ පඬියන්ට ඉඩදෙමු ද?

නොවැම්බර් මස දහහත්වැනි දා පවත්වන ලද ජනාධිපතිවරණයේ දී සිංහල ජනතාව ඉතා පැහැදිළි තීන්දුවක් ඒකීය රාජ්‍යය සම්බන්ධයෙන් දී ඇත. ඔවුන්ට අවශ්‍යවන්නේ ඒකීය රාජ්‍යය තවදුරටත් පවත්වාගෙනයෑම ය. සන්ධීය රාජ්‍යයකට ඔවුහු විරුද්ධවෙති. මහින්ද රාජපක්ෂ මහතාට ඡන්දය දුන් අයගෙන් අති විශාල බහුතරයට අවශ්‍යවනුයේ ඒකීය රාජ්‍යය නොබිඳ පවත්වාගෙන යෑම ය. මැතිවරණ වේදිකාවේ ප්‍රධාන ම මාතෘකාව වුයේ ද ඒකීය රාජ්‍යය ය. එය රටේ ස්වෛරීභාවය සමග බැඳී ඇත. රනිල් වික්‍රමසිංහ මහතාගේ හාල්මැස්සන් හා පරිප්පු අමතක කර මේ රටේ අහිංසක ජනතාව රට වෙනුවෙන් ඡන්දය දුන්හ. අද ඡන්දදායකයා තම යුතුකම ඉටුකර පැත්තකට වී ඇත. බටහිර කසිකබල් ප්‍රජාතන්ත්‍රවාදය අනුව ඡන්දදායකයාට නැවතත් වැදගත්කමක් ලැබෙනුයේ ඊළඟ මැතිවරණයේ දී ය. එතෙක් වැදගත්වන්නෝ ජනාධිපතිවරණයට මුදල් දුන්නෝ, ඇතැම් ව්‍යාපාරිකයෝ, ඊනියා බුද්ධිමත්තු ආදීහු ය. අවසානයේ දී කියැවුණු අය තමන් ඉගෙනගත් බටහිර දැනුම ඔස්සේ ජනතාව රවටති. ජීවිතයේ කිසි දිනෙක සංකල්පයක් ප්‍රවාදයක් නිර්මානයකර නොමැති මොවුහු බුද්ධිමත්තු නො වෙති. මොවුහු පඬියෝ හා ඊනියා ප්‍රබුද්ධයෝ වෙති. බුද්ධිමතුන් නොවන මේ පඬියන්ගේ නුවණ ඔවුන්ගෙන් ඇතමකුගේ රැවුලේ දිග තරමටවත් නැත.

සිංහල බෞද්ධයන් මෙන් ම ක්‍රිස්තියානි හා කතෝලික බැතිමතුන්ද අතිවිශාල බහුතරය ඒකීය රාජ්‍යයක් සඳහා ඡන්දය දුන්න ද මහින්ද රාජපෂ මහතාට ආධාරකළ පඬියන්ගෙන් බොහෝ දෙනකු දිගින් දිගට ම රැඳීසිටියේ සන්ධීය හෙවත් ෆෙඩරල් සංකල්පයෙහි ය. ඔවුන් ඒකීය රාජ්‍යයක් වෙනුවෙන් කතාකෙළේ නම් ඒ අව්‍යාජව නො වෙයි. ඔවුන් කිසි දිනෙක ඒකීය රාජ්‍යය වෙනුවෙන් කිසිවක් ලියා නැත. කපන්න බැරි අත සිඹීමේ ප්‍රතිපත්තිය අනුගමනයකරමින් ඔවුහු මහින්ද චින්තනයේ සඳහන් ඒකීය රාජ්‍යය මුවින් නොබැණ ඉවසූහ. ඒ හුදෙක් මහින්ද රාජපක්ෂ මහතාගේ ජයග්‍රහණය ඒ මත රැඳී ඇතැයි ඔවුන් සිතූ බැවින් ය. ඔවුන්ට අවශ්‍ය වූයේ ජනතාව රැවටීම ය. මෙරට රාජ්‍ය මාධ්‍යවල ඉහළ තනතුරු හොබවන්නන්ගෙන් බොහෝ දෙනෙක් ද සන්ධාන ආණ්ඩුව යටතේ සංස්ථා සභාපතිකම් සහ වෙනත් නිලතල දැරූ බොහෝ අය ද දීනව බටහිර දැනුම් ආධිපත්‍යයට යටවී ඒකීය රාජ්‍යයට විරුද්ධ වෙති. ඔවුන් විසින් එදත් අදත් අප හැඳින්වෙන්නේ ජාතිවාදීන් ලෙස ය. එහෙත් මොවුන් දන්නා ජාතිවාදයක් නැත. ජාතිවාදය යනු කුමක් දැයි ඔවුන් නිර්වචනය කරන්නේ කෙසේ ද? ජනාධිපතිවරණය කාලයෙහි දී ඇතැම් රාජ්‍ය ජනමාධ්‍ය ඊනියා මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් අනුගමනය කළ බව රහසක් නො වෙයි. ඔවුන් එසේ කෙළේ මහින්ද රාජපක්ෂ මහතා දිනනු දැකීම රිසි නොවූ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය සතුටු කිරීමට මිස ඔවුන්ගේ ඊනියා මධ්‍යස්ථභාවයක් නිසා නො වෙයි. යම් අයුරකින් අනුර බණ්ඩාරනායක මහතා ජනාධිපති අපේක්ෂකයා වී නම් ඒ මධ්‍යස්ථභාවය ඒ ඒ ආයතන අසළ වූ බේරේ වැවෙහි ගිල්වා තිබෙනු හෝ බොරැල්ල කනත්තෙහි වළදමා තිබෙනු හෝ දැකගැනීමට හැකිවීමට තිබුණි.

නොයෙකුත් වර්ගවල පඬියෝ අද තම වෙස්මුහුණු ගලවාදමා ජනමාධ්‍ය ඔස්සේ නැවතත් කරළියට පැමිණීමට වෙර දරති. අද රජයේ ජනමාධ්‍යවල ඊනියා දේශපාලන සාකච්ඡා සඳහා කැඳවනු ලබන්නේ සන්ධීය රාජ්‍යයකට පක්ෂපාතිවූවන් මිස ඒකීය රාජ්‍යය වෙනුවෙන් පෙනී සිටින්නන් නො වෙයි. ඔවුන් ඒ සාකච්ඡාවලදී කොටි සංවිධානයට විරුද්ධව කතාකරනු දක්නට හැකි ය. එහෙත් ඔවුහු දෙමළ ජාතිවාදයට විරුද්ධ නො වෙති. ඔවුන් බටහිර මතවාද ඇදබාන්නේ තම දීනත්වය පෙන්නුම්කරමින් ය. බටහිර කිසිම රටක ඔවුන් ඇදබාන බහුවිධත්වයක් නැත. ඒ සෑම රටකම ඇත්තේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යයක් හා ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තන ආධිපත්‍යයකි. සුසමාදර්ශය (පැරඩයිමය) යනු කුමක්දැයි නොතේරෙන මේ පඬියන්ට එයට වඩා ගැඹුරු වූ චින්තනය නම් සංකල්පය තේරෙන්නේ යැයි සිතිය නො හැකි ය. සුසමාදර්ශය යන්න හරිහැටි තේරුම්ගැනීමට නිව්ටෝනීය යාන්ත්‍රිකය හා අයින්ස්ටයිනීය යාන්ත්‍රිකය අතර ඇති වෙනස තේරුම්ගත යුතු ය. කුන් පඬිවරයා තම සුසමාදර්ශය නම් සංකල්පය ඉදිරිපත්කරන්නේ නිව්ටෝනීය හා අයින්ස්ටයිනීය යාන්ත්‍රික ඔස්සේ ය. කාලය හා අවකාශය ගැන මැත දෙඩෙව්ව ද අයින්ස්ටයින් පඬිවරයා සිදුකළ වෙනස මේ පඬියන්ට නොතේරෙයි. මේ පඬියන් දන්නේ එවැනි දෑ ගැන කිසිත් නොදත් අහිංසක ජනතාව ඉදිරියේ තමන්ට ද නොතේරෙන වචන වැමෑරීම පමණකි. ඒ කෙසේ වෙතත් බටහිර බහුවිධත්වයක් වේ ද? එහි ඇත්තේ ව්‍යාජ බහුවිධත්වයකි. ඒ කිසිම රටක ක්‍රිස්තියානි නොවන සංස්කෘතියකට ක්‍රිස්තියානි සංස්කෘතියට ඇති ආධිපත්‍යය නොමැත. සාමාන්‍ය කාලයක දී ඕනෑම සංස්කෘතියකට තැනක් ඇතැයි කියන නමුත්, බහුවිධ සංස්කෘතීන් ගැන කතාකරන නමුත්, යම් අයුරකින් ක්‍රිස්තියානි සංස්කෘතියකට තර්ජනයක් එල්ලවුවහොත්

© Prof. Nalin De Silva

ඔවුන් ක්‍රියාකරන ආකාරය පසුගිය දා බ්‍රිතානියේ හා ඕස්ට්‍රේලියාවේ සිදු වූ දැයින් හා අද ප්‍රංශයේ සිදුවන දැයින් හෙළිවෙයි. අද ප්‍රංශයේ අප්‍රිකානු සම්භවයක් ඇති මුස්ලිමුන් කුපිත වී ඇත.මේ කිසිම රටක බෞද්ධයකුට අගමැති හෝ ජනාධිපති හෝ වීමේ ඉඩක් තිබේදැයි දීන පඬියන්ගෙන් අසනු කැමැත්තෙමි.

දීන පඬියන් ඒ රටවල ජනවර්ග අතර සමානත්වයක් නැති බව තේරුම් නොගන්නේ බටහිර ගැති දීනකම නිසාම ය. ඕනෑම පුරවැසියකු නීතිය ඉදිරියේ වෙනත් ඕනෑම පුරවැසියකුට සමාන වුව ද සමාජයෙහි සමාන නොවන බව බටහිර රටවල ටික කලක් හෝ වාසයකර ඇති සියළුම දෙනා දනිති. එහෙත් පඬියෝ ඒ බව ප්‍රසිද්ධියේ නො කියති. බටහිර සමාජයෙහි අප්‍රිකානු සම්භවයක් ඇති බොහෝ කළු අයට ඇති තැනවත් ආසියාතිකයකුට නැත. අප්‍රිකානු සම්භවයක් ඇත්තා ක්‍රිස්තියානි සංස්කෘතියට අයත්වූවකු විය හැකි ය. එහෙත් ආසියාතිකයා බොහෝවිට හින්දු, මුස්ලිම් හෝ බෞද්ධ වීම හේතුවෙන් ක්‍රිස්තියානි සංස්කෘතියට අයත් නො වෙයි. සංස්කෘතියෙන් ක්‍රිස්තියානි වූ ඕල්කට් බෞද්ධයන් දෙස වුව ද බටහිරයන් බලන්නේ අමුතු සතකු දෙස බලන ආකාරයට ය. මේ තත්ත්වය බටහිර විශ්වවිද්‍යාලවල අඩු නමුත් මුළුමනින් ම නැත්තේ නො වෙයි. ඒ සියල්ල පසෙකින් තබමු. බටහිරයෝ තම දැනුමට දෙන වැදගත්කම අනෙක් දැනුම්වලට නො දෙති. බහුවිධ දැනුමකට බටහිර ඉඩක් වෙයි ද? බටහිර ඇත්තේ බටහිරයන්ගේ දැනුමේ ආධිපත්‍යයකි. එය මුළු ලෝකයෙහි ම ව්‍යාප්තකෙරී ඇත. බටහිරයෝ අනෙක් දැනුම් යනු දැනුම් නොව මතවාද පමණක් බවට ද දැනුමක් (මතවාදයක්) නිර්මානයකරති. අද පඬියන් ඇදබාන්නේ ඔවුන් විසින් නිර්මානයකෙරුණු දැනුමක් නොව බටහිරයන්ගේ දැනුම ය. බටහිරයෝ තම රටවල ඊනියා බහුවිධත්වයක් ඇති බවට දැනුමක් නිර්මානයකර එය පඬියන්ට පොවා පඬියන් හරහා ලංකාවේ ද ඊනියා බහුවිධත්වයක් ඇතිකරන ලෙස කියති. බටහිර රටවල නැති නිදහසක් ලංකාවේ ඊනියා සුළු ජනවර්ගවලට ඇත. අප කියා සිටින්නේ මෙරට සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි තැන අහිමි නොකරන ලෙස ය. පුද්ගලයන් නීතිය ඉදිරියේ පමණක් නොව සමාජයේ ද සමාන ලෙස සැලකීම සිංහල බෞද්ධයන්ට ප්‍රශ්නයක් නො වෙයි. එහෙත් රටක විවිධ සංස්කෘතීන් කිසිවිටෙකත් කිසිම රටකවත් සමාන වන්නේ නො වෙයි. ඉතිහාසයක් ඇති එවැනි රටක් පෙන්වීමට පඬියන්ට හැකි ද? එසේත් නැත්නම් පඬියන්ට ඒ ඒ නාලිකාවල වැඩසටහන් ලබාදෙන නිෂ්පාදකවරුන්ට ඒ බව පෙන්විය හැකි ද? ලංකාවේ සිංහල බෞද්ධ සංස්කෘතියට හිමිවිය යුතු විශේෂ තත්ත්වය නැතිවීම මෙරට ප්‍රශ්නය වෙයි. කොටි සංවිධානයට විරුද්ධ වූ පමණින් යමකු ජාතික බලවේගයට අයත්වන්නේ යැයි ගම්‍ය නො වෙයි. අද ජාතිකත්වය තීරණයවීමේ දී අනිවාර්ය අවශ්‍යතාවක් වනුයේ ඒකීය රාජ්‍යයට පක්ෂපාති ද යන්න ය.

මෙරට ඇත්තේ සිංහලයන්ට හා සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි තැන අහිමිකිරීම පිළිබඳ ප්‍රශ්නයක් මිස දෙමළ ජනයාට දෙමළ වීම නිසා ම වූ අසාධාරණයක් පිළිබඳ ප්‍රශ්නයක් නො වේ. බෞද්ධයන් යටත්විජිතවාදීන් විසින් නැතිකෙරුණු තැන යළි හිමිකරගැනීමේ දී ඇතැම් ජනවර්ගවලට යටත්විජිතවාදීන්ගෙන් ලත් වරප්‍රසාද නැති වෙයි. ලන්දේසීන් ඇතිකළ, බ්‍රිතානීන් පෝෂණයකළ දෙමළ ජාතිවාදය සිංහලයන්ට විරුද්ධව ක්‍රියාකිරීම ඇරඹුනේ 1912 තරම් ඈතක ය. ඉංගිරිසි කතාකරන දෙමළ නායකයෝ තමන්ට බ්‍රිතානීන්ගෙන් ලැබුණු වරප්‍රසාද හා තනතුරු නැතිකරගැනීමට අකමැතිවූහ. එහෙත් එලෙස නැතිවන්නේ අයිතිවාසිකම් නොවන බව තේරුම්ගත් පිරිසක් ලංකාවේ වෙති. ඒ සාමාන්‍ය සිංහල ක්‍රිස්තියානි හා කතෝලික ජනතාව ය. ප්‍රභූ සිංහල ක්‍රිස්තියානීන් (කතෝලිකයන් ද ඇතුළුව) බ්‍රිතානීන්ගෙන් තමන් ලත් වරප්‍රසාද අහිමිවීමේ දී (අර ක්‍රිස්තියානීන් අවදිවව් යනුවෙන් දැන්වීම් පළකළ වත්මන් ව්‍යාපාරිකයා මෙන්) සිංහල බෞද්ධයන්ට එරෙහිව කටයුතු කළ ද, සාමාන්‍ය සිංහල කිතුණුවෝ එසේ නො කළහ. ඒ බව ප්‍රභාකරන් ඔහුගේ සීයලා බාප්පලා හා මස්සිනාලා කෘතියෙහි ද සඳහන්කෙරී ඇත. සාමාන්‍ය සිංහල කිතුණුවන් මෙවර කොළඹ මහනුවර දෙහිවල නාගරික සීමාවලින් ඔබ්බෙහි වෙසෙන සිංහල බෞද්ධයන් සමග මහින්ද රාජපක්ෂ මහතාට ඡන්දය දී ඇත. ඒ බව ජාඇල, කටාන, වෙන්නප්පුව, නාත්තන්ඩිය ඡන්ද ප්‍රතිඵලවලින් පැහැදිළි වෙයි. මෙරට ප්‍රශ්නය නිසියාකාරයෙන් තේරුම්ගැනීමත්, තම ප්‍රභූ නායක පූජකවරුන්ගේ හා ව්‍යාපාරිකයන්ගේ බහට බැටළුවන් මෙන් අවනත නොවීමත් පිළිබඳ ව සිංහල කිතුණුවන්ට සිංහල බෞද්ධයන්ගේ ගෞරවය හිමිවිය යුතුවෙයි. ඉංගිරිසි කතාකරන දෙමළ ජනයා සාමාන්‍ය සිංහල කිතුණුවන් මෙන් කටයුතු කෙළේ නම් මෙරට දෙමළ ජාතිවාදී ප්‍රශ්නයක් නැත. ජනවාර්ගික ප්‍රශ්නයක් ඇතැයි කියමින් පඬියන් සන්ධීය විසඳුමක් ගැන මැත දොඩවන්නේ ඔවුන්ගේ දීන ගැති බව හේතුවෙන් බටහිර දැනුම් ආධිපත්‍යයට යටවීමෙන් ය. අපි මේ පඬියන්ට හා මාධ්‍යට ජනමතය ගසාකෑමට ඉඩදෙමු ද?

© Prof. Nalin De Silva